සැ. යු.-2009.09.18 දින පළ වූ අංක 1,620 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,621 - 2009 සැප්තැම්බර් මස 25 වැනි සිකුරාදා - 2009.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1566 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1566 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1570 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ඔක්තෝබර් මස 02 වැනි දින පළ කරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2009 සැප්තැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂ්මන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වැනි කොටසේ 32(1) වගන්තිය යටතේ
වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත් කිරීම්

| අනු. අංකය | නම/සේවය/පන්තිය/ශ්‍රේණිය | පත්කරන ලද තනතුර/කාර්යාලය/ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|
| 01 | ඩබ්ලිව්. එම්. එම්. බී. වීරසේකර මහතා<br>ශ්‍රී. ලං.ප. සේ. II පන්තිය | 2009.08.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩ බැලීම සඳහා |
| 02 | පී. බී. එම්. සිරිසේන මහතා<br>ශ්‍රී. ලං.ප.සේ. I පන්තිය | 2009.08.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සභා ලේකම් කාර්යාලයේ, සභා ලේකම් තනතුර සඳහා |
| 03 | ජේ. ජී. එන්. තිලකරත්න මහතා<br>ශ්‍රී. ලං. අ.ප.සේ. I පන්තිය | 2009.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 04 | කේ. ඊ. එන්. ජී. ඩබ්. බණ්ඩාර මහතා<br>ශ්‍රී. ලං. අ.ප.සේ. II පන්තිය | 2008.12.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුලියාපිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරේ වැඩබැලීම සඳහා |
| 05 | ආර්. ආර්. එම්. ස්වර්ණලතා මිය.<br>ශ්‍රී. ලං. අ. ප. සේ. III පන්තිය | 2009.08.12 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල කලාප අධ්‍යාපන කාර්යාලයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (භාෂා හා මානව ශාස්ත්‍ර) තනතුර සඳහා |
| 06 | ඩී. එම්. කේ. දසනායක මහතා<br>ශ්‍රී. ලං. ග. සේ. II/I පන්තිය | 2009.07.16 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තනතුර සඳහා |
| 07 | ඩබ්ලිව්. ප්‍රේමසිරි මහතා<br>ශ්‍රී. ලං. ග. සේ. II/II පන්තිය | 2009.07.16 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී තනතුර සඳහා |
| 08 | ඒ. එල්. කේ. එම්. සී. කුමාරිහාමි මිය.<br>පළාත් ආදායම් සේවයේ I පන්තිය | 2009.02.16 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා |
| 09 | ඒ. එල්. කේ. එම්. සී. කුමාරිහාමි මිය.<br>පළාත් ආදායම් සේවයේ I පන්තිය | 2009.08.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් කොමසාරිස් තනතුරේ වැඩ බැලීම සඳහා |

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආර්. ඒ. තිලකරත්න,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2009 සැප්තැම්බර් මස 01 වැනි දින,
වයඹ ආණ්ඩුකාරවර කාර්යාලය.

09-779

# පළාත් සභා නිවේදන

## දකුණු පළාත් සභාව

2009 අංක 1 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් 2009.07.14 වැනි දින සම්මත කරන ලදුව 2009.08.03 වැනි දින ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කොට ඇති ඉහත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පළ කරමි.

ශාන් විජය ලාල් ද සිල්වා,
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, පළාත් පාලන, අධ්‍යාපන, ප්‍රවාහන, සංස්කෘතික,
පරිසර, ප්‍රවෘත්ති, ජල සම්පාදන, වතු යටිතල පහසුකම් හා සංචාරක අමාත්‍ය,
දකුණු පළාත.

2009 අගෝස්තු මස 03 වැනි දින,
ඉහල ඩික්සන් පාර,
ගාල්ල.

## 2009 අංක 1 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධිත) ප්‍රඥප්තිය

දකුණු පළාත් සභාවේ 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :–

01. මෙම ප්‍රඥප්තිය 2009 අංක 1 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, දකුණු පළාත් ආණ්ඩුකාරවරියගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේය.

02. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ප්‍රඥප්තියේ පහත සඳහන් වගන්ති හා ඡේද මෙයින් සංශෝධනය කරනු ලැබේ.

03. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ ආරම්භක ඡේදයේ පළමු පේළියේ "දකුණු පළාත ඇතුලත මුලාරම්භ වන" යන වචනවලින් ඉක්බිතිව, හා "දකුණු පළාත තුලට පැමිණෙන හෝ හරහා යන'' වචන අදාල පේළියට එකතු කිරීම.

03. (2) ප්‍රධාන ප්‍රඥප්තියේ පූර්විකාවේ "ඇ" ඡේදය ඉවත් කර පහත සඳහන් "ඇ" හා "ඈ" ඡේද ආදේශ කිරීම :–

(ඇ) මහජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවයන් ආරක්ෂා සහිතව සුවපහසුව හා කාර්යක්ෂමව ඉටු කිරීමට නියැලී සිටින රාජ්‍ය හා පෞද්ගලික යන දෙපාර්ශවයේම ප්‍රවාහන සේවාවන් විධිමත් කිරීම.
(ඈ) විධිමත් කරනු ලබන සියලුම මගී හා අනෙකුත් ප්‍රවාහන සේවාවන් සඳහා යටිතල පහසුකම් සැලසීම.

04. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන වගන්තියේ (1) (අ) ඡේදයේ "නිල බලයෙන් සාමාජිකයින් තිදෙනෙක් වේ." යන්න වෙනුවට, "නිල බලයෙන් සාමාජිකයින් පස්දෙනෙක් වේ" යන වචන ආදේශ කිරීම.

05. ප්‍රධාන ප්‍රඥප්තියේ 3(1) (අ) වගන්තියේ (III) ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන නව ඡේදය (IV) වශයෙන් එකතු කිරීම :–

(IV) අදාල විෂයභාර අමාත්‍යවරයාගෙන් විමසා පළාත් පාලන කොමසාරිස් හා පළාත් මෝටර් රථ කොමසාරිස් සහ

06. "ප්‍රධාන ප්‍රඥප්තියේ" (3) (1) (ආ) "ඡේදය" (ආ) (II) "වශයෙන් නම් කරන අතර, ඊට පෙරාතුව (ආ) (I) වශයෙන් පහත සඳහන් ඡේදය ආදේශ කිරීම.

(ආ) (I) අමාත්‍යතුමාගේ අභිමතය පරිදි පෞද්ගලික බස්රථ ආයෝජන සමාගම් සහ ශ්‍රී ලංගම හෝ, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ නියෝජනය වන පරිදි අධ්‍යක්ෂ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවකුගේ මට්ටමේ පුද්ගලයන් දෙදෙනෙක් හා

07. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වැනි වගන්තියේ 1 වැනි කොටසේ (අ) (ආ) (ඇ) (ඊ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් ඡේද ආදේශ කිරීම :–

(අ) (i) පළාත ඇතුලත ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත්, පිළිගත හැකි, ගුණාත්මක තත්වයක මගී හා භාණ්ඩ සේවා පවතින්නේ ද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම, සමීක්ෂණ පැවැත්වීම හා එම සේවා විධිමත් කිරීමට අවශ්‍ය ප්‍රමිතීන් නියම කිරීම ;

(ii) මගී ප්‍රවාහන සේවා සඳහා විද්‍යාත්මකව තීරණය කරනු ලබන පොදු කාලසටහන් සැලසුම් කිරීම, පිළියෙල කිරීම, එම කාල සටහන් පරිදි ධාවනය කළ යුතු බවට සියලුම ධාවන පාර්ශ්වයන්ට නියෝග කිරීම හා ක්‍රියාත්මක කිරීම ;

(iii) දකුණු පළාත් සභාව හා අනිකුත් පළාත් සභා අතර, අදාල පාර්ශ්වයනගේ එකඟතාවය මත ගමනාගමන අවශ්‍යතා සපුරාලීම සඳහා ඒකාබද්ධ සේවා, සම්බන්ධ සේවා හෝ පළාත් අතර සේවා සැලසුම් කිරීම, බලාත්මක කිරීම සහ රෙගුලාසි පැනවීම ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ ද එකඟතාවය මත කළ යුතුය.

(ආ) මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට හෝ අනුමත වෙනත් මෝටර් වාහන යෙදවීමට බලය දෙන මගී සේවා අවසරපත් නිකුත් කිරීම, ලියාපදිංචි කිරීම හෝ වෙනත් අධිකාරි බලයක් ලබාදීම.

(ඇ) 7(ආ) වගන්තියේ සඳහන් අවසරපත්‍ර හෝ ලියාපදිංචි කිරීමට අදාල කොන්දේසි නියම කිරීම, මගීන්ගේ ආරක්ෂාව හා ගුණාත්මක සේවාවක් ලබාදීමට අදාල කොන්දේසි නියම කිරීම, සියලු පාර්ශ්වයන් එම කොන්දේසි පිළිපදින බවට වගබලා ගැනීම.

(ඊ) (i) මගී හා අනෙකුත් ප්‍රවාහන සේවාවල ආයෝජකයන් දැනුවත් කිරීම, මාර්ගෝපදේශකත්වය සැපයීම, පහසුකම් සැලසීම හා සියලුම ප්‍රවාහන වෘත්තිකයින් පුහුණු කිරීම, සහතික නිකුත් කිරීම හා එම සේවා ප්‍රයෝජනයට ගනු ලබන පිරිස් දැනුවත් කිරීම හා සංවිධානය කිරීම.

(ii) ගුණාත්මක සේවා අවශ්‍යතා සපුරා ගැනීමට හැකිවන පරිදි අධිකාරිය විසින් හෝ අධිකාරිය හා සම්බන්ධ සමාගමක් වශයෙන් හෝ වෙනත් ආයතනයක් සමග ඒකාබද්ධව හෝ පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම හා අවශ්‍ය සංවර්ධන කටයුතු කිරීම.

08. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වැනි වගන්තියේ (1) ඡේදයේ "කිසිම තැනැත්තකු" යන වචනවලින් ඉක්බිතිව "හෝ පුද්ගල මණ්ඩලයක්" යන වචන ද එම ඡේදයට එකතු කිරීම.

09. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වැනි වගන්තියේ (3) ඡේදයේ "නිත්‍ය සේවා සඳහා බස්රථයක්" යන වචනවලින් ඉක්බිතිව "හෝ මගී ප්‍රවාහනයට අනුමත" යන වචන ද එම ඡේදයට එකතු කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (5) ඡේදය (5) (I) වශයෙන් නම් කරන අතර, එම 1 ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන අංක : 5(II) දරන අලුත් ඡේදය එකතු කිරීම :-

(5) (II) නැතහොත් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වැරදිකරු කරනු ලැබුවහොත් ඔහු රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ සුලුවැඩ සහිත අවුරුදු දෙකකට නොවැඩි කාලයකට බන්ධනාගාරගත කිරීමට හෝ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම යටත් කිරීමට හෝ හැකිය.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 10(7) ඡේදයට ඉක්බිතිව (8) ඡේදය වශයෙන් පහත සඳහන් අලුත් ඡේදය එකතු කිරීමෙන් :

"(8) ත්‍රී රෝද රථ හෝ පාසල් වෑන් රථ හෝ කුලී වෑන් රථ හෝ මගී ප්‍රවාහනයට සම්බන්ධ අනුමත වාහන ලෙස අධිකාරිය විසින් නියම කරන වාහන නියම කරන දිනයක සිට අධිකාරියේ අවසර පත්‍රයක් ලබා හෝ ලියාපදිංචි වීමක් නොමැතිව වෙන් වෙන් වශයෙන් ගාස්තු අයකිරීමකින් හෝ කුලී පදනම මත ගාස්තු අය කිරීමකින් හෝ මගී ප්‍රවාහන සේවයේ නොයෙදිය යුතුය. බස්රථ නොවන අනෙකුත් මගී ප්‍රවාහන වාහන ලියාපදිංචි කිරීම විධිමත් කිරීම හා ඊට අදාල අනෙකුත් කරුණු සම්බන්ධව අධිකාරියට රෙගුලාසි පැනවිය හැකිය."

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වගන්තිය (1) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :

"15(1) අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා සුදුසු පුද්ගලයෙකු තේරීම සඳහා ටෙන්ඩර් පටිපාටිය හෝ වෙනත් සාධාරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට හැකි අතර, ඒ සඳහා අධිකාරිය නියම කරන හෝ එකඟවන ගාස්තු නොගෙවා කිසි පුද්ගලයෙකුට අවසරපත්‍ර නිකුත් නොකළ යුතුය. එහෙත් ශ්‍රී ලංගම හෝ වෙනත් රාජ්‍ය ප්‍රවාහන ආයතනයක ඉල්ලීමකට මෙම ඡේදය ඒ ආකාරයෙන් බල පැවැත්වෙන ලෙස නොසැලකිය යුතුය."

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 15(3) ඡේදය "ජනතා සන්තක මගී ප්‍රවාහන සේවා සමාගම" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය" යන වචන ආදේශ කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වැනි වගන්තියේ (VI) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් ඡේදය එකතු කිරීමෙන් :

"VI අවසර පත්‍ර ධාරියා විසින් බස් රථයේ සේවයේ යොදන කොන්දොස්තරවරයා මගින් නැතහොත් කොන්දොස්තරවරයාගේ කාර්ය ඉටුකරන පුද්ගලයා මගින් අයකළ ගාස්තුව, මගියාගේ ගමනාරම්භය හා ගමනාන්තය, (නමින් හෝ ගාස්තු අවස්ථා අංකයෙන්) එකී බස්රථයේ ලියාපදිංචි අංකය හෝ සමාගමේ හෝ ආයතනයේ හෝ නම, අනුක්‍රමික අංකය සහිත "ප්‍රවේශපත්‍රයක්" සෑම මගියෙකුටම නිකුත් කරවීමට ක්‍රියාකළ යුතුය. අනු පිටපත් සහිත ප්‍රවේශ පත්‍ර පොත්, මිල මුද්‍රිත ප්‍රවේශපත්‍ර හෝ යන්ත්‍රානුසාරයෙන් නිකුත් කරන ප්‍රවේශපත්‍ර මේ සඳහා භාවිතා කළ හැකිය. යන්ත්‍රානුසාරයෙන් ප්‍රවේශපත්‍ර නිකුත් නොකරන අවස්ථාවල නිකුත් කරන ප්‍රවේශපත්‍රවල වලංගුභාවය තහවුරු කිරීම සඳහා ගමන්වාර අනුක්‍රමික අංක සටහන් කළ හැකි සටහනක් (මගී ලේඛනයක්) සෑම කොන්දොස්තරවරයෙකු විසින්ම පිරවිය යුතුය.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වැනි වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"18(I) දකුණු පළාත් සභාව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව හෝ වෙනත් යම් පළාත් සභාවක් විසින් අවසරපත්‍රයක් ප්‍රදානය කර ඇති කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගල මණ්ඩලයකට අධිකාරිය විසින් නියෝග නිකුත් කළ හැකි අතර, එම නියෝග දකුණු පළාත් බල ප්‍රදේශයේ දී පිළිපැදිය යුතුය.".

"18(II) මෙම අධිකාරියේ එකඟතාවයකින් තොරව නිකුත් කර ඇති අවසර පත්‍රයක් නිසා පළාත ඇතුලත විධිමත් සේවා වලට බාධා හෝ හානි වන්නේ නම් එම අවසර පත්‍රය යටතේ ධාවනය වන බස්රථය නතර කරවීම, තාවකාලිකව නතර කරවීම, පහසුකම් ලබා නොදීම හෝ වෙනත් ක්‍රියා මාර්ග ගැනීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව දැනුවත් කර අවශ්‍ය පරිදි කටයුතු කිරීමට අධිකාරියට බලය ඇත".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වැනි වගන්තිය ඉවත් කර පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"19 යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් ඔහුගේ කැමැත්ත පරිදි වෙනත් තැනැත්තකු වෙත පැවරිය නොහැක. එවැනි පැවරීමක් ශූන්‍ය හා බලරහිත වේ. එවැනි අවස්ථාවක් අනාවරණය වුවහොත් එම බලපත්‍රය අවලංගු කළ යුතුය. එසේ වුව ද අධිකාරියේ ප්‍රතිපත්තියට හානි නොවන්නා වූ ද, ගුණාත්මක බස් සේවාවක් සඳහා අධිකාරිය අවශ්‍ය යැයි සලකනු ලබන අවස්ථාවල දී බලපත්‍රවල අයිතිය සංශෝධනය කිරීමේ ක්‍රියා මාර්ග ගත හැකිය. ඒ සඳහා අධිකාරියට රෙගුලාසි පැනවිය හැකිය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වගන්තියේ (I) ඡේදය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කරනු ලැබේ.

"21.1. බලපත්‍ර අයිතිය සංශෝධනය කිරීමක දී තිබූ බලපත්‍රයේ සියලුම හිමිකම් ලබාදීමට අධිකාරිය බැඳී නැත. මෙවැනි සංශෝධනයක දී අදාල මාර්ගයේ පොරොත්තු බස්රථ හිමියන්ට එහි කාලසටහන් ඉල්ලා සිටීමට අයිතිවාසිකමක් ද නොමැත.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වගන්තියේ (III) ඡේදයේ "අවසර පත්‍රය අලුත් කිරීම සඳහා නියම කර ඇති ගාස්තු" යන වචන ඉවත් කර "අධිකාරියට ගෙවිය යුතු බවට නියම කර ඇති සියලුම ගාස්තු" යනුවෙන් ආදේශ කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (IV) ඡේදයට පසුව එන ඡේදයේ 5 වන පේළියේ "මාස 3 කට වැඩි කාලයකට අත්හිටුවීම" යන්න අවලංගු කර "මාස තුනකට නොවැඩි කාලයක් අත්හිටුවීම" වශයෙන් සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (2) ඡේදය ඉවත් කර ඒ වෙනුවට 2(I), 2(II), 2(III) වශයෙන් පහත සඳහන් ඡේද තුන ආදේශ කිරීම.

28(2)(i) ඒ ඒ මාර්ග සඳහා මගී අවශ්‍යතාවයට අනුව පොදු කාලසටහන් සකස් කිරීම, එම කාලසටහන් ධාවකයින් අතර සාධාරණ ලෙස බෙදාදීම, බස්නැවතුම්පොල වල හෝ බස්ගාල් වල හෝ අතරමග ස්ථානවලින් හෝ එම සේවාවන් ක්‍රියාත්මක කිරීම, කාලසටහන් වලට අනුව ධාවනය වන්නේදැයි පරීක්ෂා කිරීම, බස්සේවා කළමනාකරණ කටයුතු සඳහා කාර්ය මණ්ඩලය යෙදවීම හා අධීක්ෂණය අධිකාරිය මගින් ඉටුකල යුතුය. ඒ සඳහා අධිකාරියට නියෝග හා රෙගුලාසි පැනවිය හැකිය.

(ii) බස්නැවතුම්පොළක සේවා පරිපාලනය හෝ කළමනාකරණය හෝ වෙනත් ආකාරයකින් මගී ප්‍රවාහන කටයුතු වලට සම්බන්ධ වීමට අධිකාරියේ අනුමැතිය තිබිය යුතුය.

(iii) අනවසරයෙන් බස්නැවතුම්පොලවලින් මගීන් ගැනීම හෝ පැටවීම, ඊට සහාය වීමට මගීන් එක්රැස් කිරීමේ අරමුණින් ශබ්ද නගා කෑගැසීම, අධිකාරියේ නිලධාරින්ගේ රාජකාරී කටයුතු වලට බාධා හෝ අවහිර වන ලෙස කටයුතු කිරීම, දඬුවම් ලැබිය හැකි වරදකි. එවැනි අවස්ථාවක පොලිස් නිලධාරීන්ට හෝ අධිකාරියේ නිලධාරීන්ට එවැනි පුද්ගලයින්ට එරෙහිව අදාල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකි අතර, නඩු විභාගයකින් වැරදිකරු වුවහොත් රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතුය.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වගන්තියේ 2 වන උප වගන්තියේ XV ඡේදය ඉවත් කර පහත සඳහන් ඡේදය ආදේශ කිරීම :
XV. ඉහත සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් හා මාර්ග අනතුරු අඩුකර ගැනීමටත්, මාර්ගය පාවිච්චි කරන සියලු දෙනාගේ ආරක්ෂාව තහවුරු වන පරිදි මාර්ග විනය නංවාලීමටත්, ඊට අදාල අනුශාංගික කරුණු සම්බන්ධයෙන් නියෝග පැනවීම හා බලාත්මක කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ඉවත් කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ "බස්රථයක" හෝ "බස්රථයක්" වශයෙන් සඳහන් වන සෑම ස්ථානයකම ඊට ඉක්බිතිව "හෝ බස් මගී ප්‍රවාහනයට අනුමත වාහනයක්" යන වචන එකතු කිරීම.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම සංශෝධිත ප්‍රඥප්තියේ "පොදු කාලසටහන" යන්නෙන් කිසියම් මාර්ගයක හෝ මාර්ග කිහිපයක මගී අවශ්‍යතාවය අනුව දිනය පුරා බස්රථ ධාවනය වන ගමන්වාර හා එම ගමන්වාර සාධාරණ ලෙස ධාවකයන් අතර, බෙදා දීමට හැකි හා මහජනයාට ප්‍රදර්ශනය කල හැකි විධිමත් කාලසටහනක් අදහස් වේ.

"ප්‍රධාන ප්‍රඥප්තිය" යන්නෙන් "1996 අංක 02 දරන දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය - ප්‍රඥප්තිය" අදහස් වේ.

මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

09-776

---

## මහනුවර මහනගර සභාවේ මහජනාධාර කමිටුවට සාමාජිකයන් පත් කිරීම

දිළිඳු සහන පනතේ 368 පරිච්ඡේදයේ 12.2 වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව මහනුවර මහ නගර සභාවේ මහජනාධාරී කමිටුවේ බාහිර සාමාජිකයින් ලෙස පහත නම් සඳහන් මහත්ම මහත්මීන් පත් කිරීම අනුමත කරන බව මෙයින් දන්වමි.

| අනු අංකය | නම | ලිපිනය |
|---|---|---|
| 1. | සීදේවි බෝවත්ත මහත්මිය | අංක 73, ගෝර්ඩන් ආර්‍යාව පාර, මහනුවර |
| 2. | කමලා සුහසිංහ මහත්මිය | අංක 32/16, සංඝරාජ මාවත, මහනුවර |
| 3. | චන්ද්‍රා මහඋල්පත මයා | අංක 07, රජපිහිල්ල මාවත, මහනුවර |
| 4. | පෙරුමාල් බාලසුබ්‍රමනියම් මයා | අංක 21/2, ගෝර්ඩන් ආර්‍යාව පාර, මහනුවර |
| 5. | එම්. ජේ. එම්. අන්වර්ඩීන් මයා | අංක 85, විලියම් ගොපල්ලව මාවත, මහනුවර |
| 6. | සුනිල් ශාන්ත ගමගේ මයා | අංක 25/21, ජෝර්ජ් ඊ ද සිල්වා මාවත, මහනුවර |

එදිරිවීර වීරවර්ධන,
මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය,
සමාජ සුභසාධන සහ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍ය.

පිටපත් : 01..ලේකම්, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය.
02. සමාජ සේවා අධ්‍යක්ෂ, මධ්‍යම පළාත.

09-778